**වැදගත්ය - හදිසිය**
චක්‍රලේඛ අංක 2010-PRE-01-St

මගේ අංකය :- PRE/10/06
මැතිවරණ දෙපාර්තමේන්තුව,
සරණ මාවත, රාජගිරිය.
2009.11.24

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
සියළුම රාජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
සියළුම රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් සහ

**ජනාධිපතිවරණය - 2010**
**කාර්ය මණ්ඩල අවශ්‍යතා**

ඉදිරියේදී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය සඳහා රජයේ / පළාත් සභා නිලධාරීන් විශාල සංඛ්‍යාවක් සේවයේ නිරත කරවීමට සිදුවන අතර වාහන විශාල සංඛ්‍යාවක්ද අවශ්‍යවේ. සියළුම රජයේ හා පළාත් සභා කාර්යාලයන්හි නිලධාරීන් හා වාහන සම්බන්ධයෙන් සංගණනයක් කිරීමට අවශ්‍යවී ඇත. (සංස්ථා සහ මණ්ඩලවලින්, වාහන පිළිබඳ විස්තරවලට අමතරව සැපයිය යුත්තේ එම ආයතනවලට ද්විතීයනය කර ඇති රජයේ නිලධාරීන්ගේ නම් පමණකි.)

02. කිසිසේත් ම ප්‍රමාද කළ නොහැකිවන්නා වූ, අත්‍යාවශ්‍ය රාජ්‍ය සේවාවන් පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍යවූවන් පමණක් හැර, අනිකුත් සියළුම රජයේ නිලධාරීන් ඡන්ද විමසීම් රාජකාරිවල යොදවනු පිණිස මෙම දෙපාර්තමේන්තුවට ලබාදීම අත්‍යාවශ්‍යය. ඡන්ද විමසීම පැවැත්වෙන දින හා එයට ආසන්නතම දින කිහිපය තුළ දී රජයේ කාර්යාලවල සාමාන්‍ය කටයුතු අවශ්‍යයෙන්ම තාවකාලිකව අත්හිටුවීමට සිදුවන අතර, මේ ඡන්ද විමසීම පවත්වනු ලබන්නේ එක් දිනක දී පමණක් වන හෙයින් අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා යෙදවිය යුතුවන නිලධාරීන්ගේ සංඛ්‍යාව දැඩි ලෙස සීමා කළ හැකිය. ඡන්ද විමසීම් රාජකාරි කටයුතුවල නිරතවීම නිසා තම තමන්ට නියමිත ඡන්ද පොළට ගොස් පුද්ගලිකව ඡන්දය දීමට නොහැකි සියළුම රජයේ නිලධාරීන්ට තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් සලසාලන විධිවිධාන අදාල ඡන්ද විමසීම් පනතට ඇතුළත් කර ඇත. තැපැල් ඡන්ද පහසුකම් පිළිබඳ වූ උපදෙස් මා විසින් යථා කාලයේදී ඔබ වෙත එවනු ලබන අතර, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මගින් ද ප්‍රචාරය කරනු ලැබේ. එම උපදෙස් පරිශීලනය කර නීතියෙන් නියම කර ඇති කාල සීමාව ඇතුළත තැපැල් ඡන්ද පහසුකම් සඳහා ඉල්ලුම් කිරීමට හැකිවන සේ සෑහෙන තරම් කල්වේලා ඇතිව මෙම උපදෙස් ඔබගේ කාර්ය මණ්ඩලයට ලැබෙන බවට වගබලා ගැනීම මැනවි. තැපැල් ඡන්ද පහසුකම් අයදුම් නොකිරීම හෝ නිවැරදි තොරතුරු සැපයීමට අපොහොසත්වීම නිසා හෝ අයදුම්පත් ප්‍රමාදවීම නිසා හෝ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප වීම ඡන්ද විමසීම් රාජකාරිවලින් නිදහස් වීමට හේතු නොවන බව අදාල සියළුම නිලධාරීන්ට අවධාරණයෙන්ම දැනුම් දිය යුතුය.

03. ඡන්ද මධ්‍යස්ථානවල / ගණන් කිරීමේ මධ්‍යස්ථානවල සේවය සඳහා යොදවනු පිණිස ඔබගේ ආයතනයේ සේවය කරන සියළුම නිලධාරීන්ගේ / නිලධාරිනියන්ගේ විස්තර මේ සමඟ සපයා ඇති ආකෘතිවල එක් එක් නිලධාරියා/නිලධාරිනිය ලවා ඇතුළත් කරවා මෙම කාර්ය භාර මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතිකකර, CSEP ආකෘති ද සම්පූර්ණ කර ආවරණ ලිපියක් ද සමඟ මෙම චක්‍රලේඛය ලැබී සති 02 ක් ඇතුළත ලැබෙන සේ මතු සඳහන් පරිදි මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත හෝ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී (දිස්ත්‍රික් ලේකම් / දිසාපති) වෙත හෝ යැවිය යුතුය. මෙම ආකෘතිපත්‍රවල අමතර පිටපත් අවශ්‍ය නම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් (කච්චේරිවලින්) / දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් ලබා ගත හැක. පහත ගණයන්ට අයත්වන නිලධාරීන් හැර, ඔබ කාර්යාලයේ සිටින සෑම නිලධාරියෙකු/නිලධාරිනියක ලවා මෙම ආකෘතිපත්‍ර සම්පූර්ණ කරවා ඉදිරිපත් කළ යුතුය.

1. මෙයට පෙර පැවති කිසියම් ඡන්ද විමසීමකදී අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වී ඇති කිසිම නිලධාරියෙකු/නිලධාරිනියෙකු හා ක්‍රියාකාරී දේශපාලනයේ නිරතවන නිලධාරීන් /නිලධාරිනියන්
2. පශ්චාත් ගර්භනී අවස්ථාවේ පසුවන නිලධාරිනියන්
3. මව්කිරි දෙන ඉතා කුඩා අතදරුවන් සිටින නිලධාරිනියන්
4. ඡන්ද විමසීම් රාජකාරි සඳහා දුර බැහැර ගමන් කිරීමට අපහසු ආබාධිත තත්වයෙන් පසුවන නිලධාරීන් / නිලධාරිනියන්
5. ඉදිරි තුන් මසක කාලය තුළ රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට නියමිත නිලධාරීන්/නිලධාරිනියන්
6. කොන්ත්‍රාත් පදනම මත සේවයේ නිරත කර ඇති නිලධාරීන් / නිලධාරිනියන්

සෙසු සියළුම නිලධාරීන් / නිලධාරිනියන් ලවා අයදුම්පත් සම්පූර්ණ කරවා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බවට ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු විසින් පරීක්ෂාකාරී විය යුතුවේ. මෙම නිලධාරියා CSEP ආකෘතියෙන් දැක්වෙන ලැයිස්තුවට අත්සන් කරන නිලධාරියා විය යුතුය.

එක් නිලධාරියෙකු වෙනුවෙන් ආකෘති පත්‍ර එක් පිටපතක් පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නිලධාරීන් වෙනත් කාර්යාලවලට අනුයුක්ත කර ඇතිවිටදී එවැනි නිලධාරීන්ගේ තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ අනුයුක්ත කර ඇති කාර්යාලය හරහාය. මෙම

ආකෘති පත්‍ර පහත සඳහන් පරිදි වර්ග පහකින් සපයා ඇති අතර නිලධාරීන් පිළිබඳ තොරතුරු සාරාංශ කර දැන්වීම සඳහා CSEP 1 (කාර්යාල) හා CSEP 2 ( පාසැල් ) ආකෘති ද සපයා ඇත.

1. සහකාර තේරීම්භාර නිලධාරී / ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති - ARO/SPO (M/F)
2. කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ලිපිකරු (පිරිමි) - JPO/CL(M)
3. කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති / ලිපිකරු (ගැහැණු) - JPO/CL (F)
4. විදුහල්පති සේවය හා ගුරු සේවය - SCH

ඉහත ARO (M), ARO (F) , SPO (M), SPO (F) , JPO (M), JPO (F), CL (M), CL (F) යන නිලධාරී කාණ්ඩ සඳහා සහ ගුරුවරුන් / ගුරුවරියන් සඳහා අදාළ පරිදි වෙන වෙනම CSEP ආකෘති සම්පූර්ණ කරන්න.

04. **නිලධාරීන් පිළිබඳ ලැයිස්තු යැවීමේ වගකීම :-** අමාත්‍යාංශයක් සම්බන්ධයෙන් නම් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකුගේ ද, දෙපාර්තමේන්තුවක් සම්බන්ධයෙන් නම් අතිරේක හෝ නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුගේ ද, ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ සංස්ථාවක් සම්බන්ධයෙන් නම් අතිරේක සාමාන්‍යාධිකාරීවරයකුගේ ද තත්ත්වයට නොඅඩු නිලයක් දරන නිලධාරියෙකු වෙත පැවරිය යුතුය.

05. **නිදහස් කිරීම :-** අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මැතිවරණ රාජකාරිවලින් නිදහස් කිරීමක් නිශ්චිතවම නිර්දේශ කරනු ලැබෙනොත් මිස නැත්නම්, සෑම නිලධාරියෙකුගේම සේවය මැතිවරණ රාජකාරි සඳහා ලබාගත හැකි සේ සළකනු ලැබේ. ඔබගේ අදහසේ හැටියට / ඔබගේ යම් ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය නිලධාරියෙකුගේ අදහසේ හැටියට හෝ ප්‍රමාද කළ නොහැකි කිසියම් අත්‍යාවශ්‍ය රාජකාරියක යෙදවීමට සිදුවන නිසා හෝ නිලධාරියෙකුගේ පෞද්ගලික හේතුවක් මත යම් නිලධාරියෙකුගේ සේවය ඡන්ද විමසීම් කටයුතු සඳහා ලබාදීමට නොහැකි වන්නේ නම්, ඊට හේතුව ආකෘති පත්‍රවල නිදහස් කිරීමට හේතු දක්වන ස්ථානයේ සඳහන් කර ඔබ විසින් වෙනම ලිපියකින් නිර්දේශ කළ යුතුය. එම නිර්දේශය අදාළ නිලධාරියාගේ විස්තර ඇතුළත් ආකෘති පත්‍රයට අමුණා එවිය යුතුය. (අවශ්‍ය නම් වැඩි විස්තර වෙනම කඩදාසියක ලියා එම ආකෘති පත්‍රයට අමුණා එවිය යුතුය.) එවැනි නිර්දේශයන් , ලිපියක් මගින් දෙපාර්තමේන්තු ප්‍රධානියා පෞද්ගලිකවම නිර්දේශ කළ යුතුය.

06. **මූලික සංගණන ලියවිලි සහ නිලධාරී දත්ත පත්‍ර එවිය යුතු ආකාරය**

**06.01** **මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත එවිය යුතු සංගණන ලේඛන**

(අ) කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රජයේ කාර්යාල

(ආ) ඉසුරුපාය, සෙත්සිරිපාය, සම්පත්පාය, ගොවිජන මන්දිරය යන කාර්යාල සංකීර්ණයන්හි හා පාර්ලිමේන්තු සංකීර්ණය තුළ පිහිටි සියළුම කාර්යාල

(ඇ) බත්තරමුල්ල ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සහ බස්නාහිර පළාතේ පළාත් සභා අමාත්‍යාංශ, සහ පාර්ලිමේන්තු සංකීර්ණය තුළ පිහිටි කාර්යාල

යන සියළුම කාර්යාලවල සේවයේ නියුතු **සහකාර තේරීම්භාර නිලධාරී** ගණයට වැටෙන සියළුම නිලධාරීන්ගේ **(ස්ත්‍රී/පුරුෂ) දත්ත පත්‍ර (ARO(M/F)) සහ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති** ගණයට වැටෙන **පිරිමි** නිලධාරීන්ගේ සියළුම දත්ත පත්‍ර **(SPO (M))** දත්ත පත්‍ර සහ මූලික සංගණන ආකෘති (CSEP 1) **රාජගිරිය මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත එවිය යුතුය.**

**06.02. කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත එවිය යුතු සංගණන ලේඛන**

(අ) ඉහත 06.1 හි සඳහන් කාර්යාලවල සෙසු නිලධාරීන්ගේ /නිලධාරිනියන්ගේ දත්ත පත්‍ර (SPO(F), JPO/CL(M), JPO/CL(F) ) හා මූලික සංගණන ආකෘති (CSEP 1)

(ආ) ඉහත 06.1 හි සඳහන් නොවන කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි සෙසු සියළුම රජයේ කාර්යාලවල සේවයේ නියුතු සියළුම නිලධාරීන්ගේ / නිලධාරිනියන්ගේ දත්ත පත්‍ර (ARO/SPO (M/F), JPO/CL (M), JPO/CL (F) ) හා මූලික සංගණන ආකෘති (CSEP 1)

(ඇ) කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි සියළුම රජයේ පාසැල්වල සේවයේ නියුතු විදුහල්පතිවරුන්/වරියන් හා ගුරුවරුන්/වරියන් ගේ දත්ත පත්‍ර (SCH) හා මූලික සංගණන ආකෘති (CSEP 2)

මෙම ලේඛන **තේරීම්භාර නිලධාරී, කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය, 395, පරණ කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයට එවිය යුතුය.**

**06.03.** **කොළඹ හැර සෙසු දිස්ත්‍රික් භාරකාර නිලධාරීන් වෙත එවිය යුතු සංගණන ලේඛන**

(අ) කොළඹ හැර සෙසු දිස්ත්‍රික්කයන්හි පිහිටි සියළුම රජයේ කාර්යාලවල සේවයේ නියුතු සියළුම නිලධාරීන්ගේ /නිලධාරිනියන්ගේ දත්ත පත්‍ර (ARO/ SPO (M/ F) SPO JPO/CL (M), JPO/CL (F) ) හා මූලික සංගණන ආකෘති (CSEP 1) ඒ ඒ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් දන්වා එවනු ලබන පරිදි **ඒ ඒ දිස්ත්‍රික්කයේ භාරකාර නිලධාරී වෙත හෝ මැතිවරණ කාර්යාලය වෙත යැවිය යුතුය.**

(ආ) කොළඹ හැර සෙසු දිස්ත්‍රික්කයන්හි පිහිටි සියළුම රජයේ පාසැල්වල සේවයේ නියුතු විදුහල්පතිවරුන් /වරියන් හා ගුරුවරුන්/වරියන් ගේ දත්ත පත්‍ර (SCH) හා මූලික සංගණන ආකෘති (CSEP 2) ) ඒ ඒ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර /සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් දන්වා එවනු ලබන පරිදි **ඒ ඒ දිස්ත්‍රික්කයේ භාරකාර නිලධාරී වෙත හෝ මැතිවරණ කාර්යාලය වෙත යැවිය යුතුය.**

**06.04.** පහත දැක්වෙන 06.05 අනුච්ඡේදයේ සඳහන් දෙපාර්තමේන්තුවල හැර අනෙකුත් සියලුම දෙපාර්තමේන්තුවල ඡන්ද විමසීම් කාර්යය සඳහා යොදවනු ලැබීමට හැකියාව ඇති සියළුම නිලධාරීන් ලවා අදාළ කාර්ය පරිපාටියට අනුව ආකෘතිපත්‍ර සම්පූර්ණ කරවා ඉදිරිපත් කරවීමට ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ක්‍රියා කළ යුතුය.

**06.05.** තැපැල් දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාමට අවශ්‍ය කාර්ය මණ්ඩලය හැර ඡන්ද විමසීම් කටයුතු සඳහා පහසුවෙන් මුදාහැරිය හැකි සියළුම නිලධාරීන් ලවා සම්පූර්ණ කරන ලද ආකෘතිපත් නියමිත ආවරණ ලිපි සමඟ ඉදිරිපත් කළ යුතු අතර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්වකීය කාර්යාලයීය නිලධාරීන්ගේ ආකෘති පත්‍ර වලට අමතරව ආරෝග්‍යශාලා කාර්යය මණ්ඩලය අතුරින් ඡන්ද විමසීම් රාජකාරි සඳහා පහසුවෙන් මුදාහැරිය හැකි නිලධාරීන් ලවා ආකෘතිපත්‍ර සම්පූර්ණ කරවා නියමිත ආවරණ ලිපි සමඟ ඉදිරිපත් කළ යුතුවේ.

07. ඒ ඒ නිලධාරීන්ගේ තොරතුරු ආකෘතිවලට ඇතුලත් කිරීමේදී මතු සඳහන් කාර්ය පරිපාටි විස්තරය අනුව ක්‍රියා කල යුතුය. තාවකාලික/අනියම්/ආදේශක/නැවත සේවයේ යෙදවූ විශ්‍රාමික නිලධාරීන් පිළිබඳ තොරතුරු සැපයීම අවශ්‍ය නැත.

**කාර්ය පරිපාටිය**

(අ) **සහකාර භාරකාර නිලධාරීන් :-**

(I) රු.22935-10x645-8x790-17x1050-53555 වැටුප් ක්‍රමය හෝ ඊට ඉහළ වැටුප් ක්‍රමයක් හිමි දීප ව්‍යාප්ත සමාන්තර කළමනාකරණ සේවාවන්හි නිලධාරීන්

සටහන :- දීප ව්‍යාප්ත සමාන්තර කළමනාකරණ සේවාවට අයත් හෝ ඒ හා සමාන්තර සංවෘත සේවාවන්ට අයත් හෝ විධායක නිලධාරීන් මෙයට පෙර පැවති ඡන්ද විමසීම්වලදී ඡන්ද මධ්‍යස්ථාන රාජකාරිවල නිරතවී ඒ පිළිබඳව පලපුරුද්දක් ලබා නොමැති නම් එවැනි නිලධාරීන් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස ඡන්ද මධ්‍යස්ථාන භාරව ක්‍රියාකරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(II) රු.240360/- හා රු.275400/- අතර වාර්ෂික ආරම්භක වැටුපක් සහිත වැටුප් ක්‍රමයක් හිමි රු.271020/- ක් හෝ ඊට ඉහළ වාර්ෂික වැටුපක් ලබන (මාසිකව රු.22585/- ක්) කළමනාකරණ සහකාර සේවයේ අධි (විශේෂ) ශ්‍රේණියේ නිලධාරීන් හා ඒ හා සමාන්තර සේවාවන්හි එවැනි නිලධාරීන්, සහ

(ආ) **ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් :-**

(I) ඉහත (අ) II හි රු. 271020/- ට අඩු වාර්ෂික වැටුපක් (මාසිකව රු.22585/- අඩු වැටුපක් ) ලබන නිලධාරීන්,

(II) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ හා ඒ හා සමාන්තර සේවාවල I වන පන්තියේ නිලධාරීන්ට අදාළ රු.17550 - 6x240-14x320-23230 මාසික වැටුප් ක්‍රමයේ හෝ ඉහළ වැටුප් ක්‍රමයක් හිමි රු.216360/- කට නොඅඩු වාර්ෂික වැටුපක් (මාසිකව රු.18030/- ක්) ලබන නිලධාරීන්,

(III) රු.18030/- කට වැඩි දීමනා රහිත මාසික වැටුපක් ලබන ආශ්‍රිත නිලධාරීන් හා කාර්යාලගත / ක්ෂේත්‍රගත නිලධාරීන් (බඳවා ගැනීමේ සුදුසුකම් ලෙස පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය අවශ්‍ය වන්නා වූ නිලධාරීන් )

**සටහන :-** 1. රු.216,360/- ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් (රු.18030/- ක් හෝ ඊට වැඩි මාසික වැටුපක් ) ලබන නමුත්, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු වශයෙන් තිබිය යුතු කාර්යක්ෂමතාවය සහ හැකියාව සහතික නොකෙරෙන වෙනත් අතකට

යොමුවූ හැකියාවන් සහිත නිලධාරීන් ජොෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් ලෙස වර්ග නොකළ යුතු අතර, ඔවුන් ලවා කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන්ට අදාළ ආකෘති පත්‍ර සම්පූර්ණ කරවා ගත යුතුය.

2. ඉහත II හි ජොෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සඳහා යෝජිත වැටුප් තලයට (මාසික රු.18030/-) වඩා අඩු වැටුපක් ලබන නමුත් මෙයට පෙර ඡන්ද විමසීම් වලදී ඡන්ද මධ්‍යස්ථාන භාරව ජොෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස ක්‍රියාකර ඇති රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ 1 පන්තියේ (හෝ එයට සමාන්තර සේවාවල 1 පන්තියේ) නිලධාරීන් හා සංවෘත සේවාවල ඒ සමාන තනතුරු දරණ දීමනා රහිත මාසිකව රු.17550/- ක් ඉක්මවන වැටුපක් ලබන නිලධාරීන් සේවා අවශ්‍යතාව අනුව ජොෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස පත්කිරීම පිළිබඳව සලකා බලනු ලබන හෙයින් එවැනි නිලධාරීන් ස්වකීය දත්ත පත්‍ර (ARO/SPO) සමඟ ඡන්ද විමසීම් රාජකාරී සම්බන්ධයෙන් වූ පලපුරුද්ද පිළිබඳව විශේෂ සටහනක් ඉදිරිපත් කළ යුතුවේ.

3. බඳවා ගැනීමේ සුදුසුකම ලෙස පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය අවශ්‍යවන්නා වූ ආශ්‍රිත නිලධාරී හා කාර්යාලගත/ක්ෂේත්‍රගත නිලධාරී තනතුරු දරණ නිලධාරීන් ඉහත සඳහන් රු. 18,030/- ට අඩු හා එහෙත් රු. 16,935/- හෝ එයට වැඩි දීමනා රහිත මාසික වැටුපක් ලබන්නේ නම් හා එම නිලධාරීන් මෙයට පෙර ඡන්ද විමසීම් වලදී ජොෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වරයෙකු ලෙස එක් වරක් හෝ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු වශයෙන් අවස්ථා තුනක දී හෝ ඡන්ද මධ්‍යස්ථාන රාජකාරිවල නිරත වී ඇත්නම් එවැනි නිලධාරීන් සේවා අවශ්‍යතා අනුව ඡන්ද මධ්‍යස්ථාන භාර ජොෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස පත්කිරීම පිළිබඳව සලකා බලනු ලබන හෙයින් එවැනි නිලධාරීන් ස්වකීය දත්ත පත්‍ර (ARO/SPO) සමඟ ඡන්ද විමසීම් රාජකාරී සම්බන්ධයෙන් වූ පලපුරුද්ද පිළිබඳව විශේෂ සටහනක් ඉදිරිපත් කළ යුතුවේ.

IV. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 වන පන්තියේ හා 2 වන පන්තියේ 1 වන ශ්‍රේණියේ විදුහල්පතිවරුන්,

V. ශ්‍රී ලංකා ගුරු සේවයේ 1 වන පන්තියේ ගුරුවරුන්

(ඇ) **කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් :-**

I. ඉහත (ආ) III ට පසු ඇති 1 සටහන අනුව කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස වර්ග කළ නිලධාරීන්

II. ඉහත (ආ) II යටතේ රු.17550-6x240-14x320-23320 හා එවැනි වැටුප් පරිමාණ හිමි වාර්ෂිකව රු.216,360/- ට අඩු (මාසිකව රු.18030/-) වැටුප් ලබන ජොෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස පත්කිරීම සඳහා අවශ්‍ය පලපුරුද්ද නොමැති නිලධාරීන් සහ

III. මාසිකව රු.18030/- ට අඩු හා රු.16935/- හෝ එයට වැඩි වැටුපක් ලබන නමුත් ජොෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස පත්කිරීම සඳහා අවශ්‍ය පලපුරුද්ද නොමැති ආශ්‍රිත හා කාර්යාලගත /ක්ෂේත්‍රගත නිලධාරීන් සහ මාසිකව රු.16935/- ට අඩු වැටුපක් ලබන ආශ්‍රිත නිලධාරීන්

IV. රු.15610-11x170-17310 වැටුප් පරිමාණයක් හෝ එයට ඉහළ වැටුප් පරිමාණයක් හිමි එනම්, වාර්ෂිකව රු.187,320/- ක් හෝ ඊට වැඩි (මාසිකව රු.15610/- ක් හෝ ඊට වැඩි) වැටුපක් ලබන නිලධාරීන්

V. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ හා 3 වන පන්තියේ විදුහල්පතිවරුන්

VI. ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ 1 වන ශ්‍රේණියේ ගුරුවරුන්

**සටහන :-** තම හැකියාව හා පුහුණුව අනුව කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු වශයෙන් තිබිය යුතු කාර්යක්ෂමතාව සහතික නොකෙරෙන වෙනත් ක්ෂේත්‍රයන්හි නියුතු නිලධාරීන් ලවා ඡන්දපොළ ලිපිකරු නිලධාරීන්ට අදාළ ආකෘති පත්‍ර සම්පූර්ණ කරවා ඉදිරිපත් කළ යුතුය.

(ඈ) **ඡන්ද පොළ ලිපිකරුවන් :-**

I. ඉහත (ඇ) (VI) ට පසු සටහනේ දැක්වෙන කාණ්ඩයට අයත් නිලධාරීන් සහ,

II. රු.13990-10x145-11x170-17310 වැටුප් පරිමාණයක් හෝ එයට ඉහළ වැටුප් පරිමාණයක් හිමි රු.167,880/- ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන (මාසිකව රු.13990- ක් හෝ ඊට වැඩි ) නිලධාරීන්,

III. ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ හා 3 වන පන්තියේ I වන හා II වන ශ්‍රේණියේ ගුරුවරුන් සහ ආධුනික ගුරුවරුන්

සටහන :- ඉහත (ඇ) II හි දැක්වෙන වැටුප් පරිමාණයට වඩා අඩු වැටුප් පරිමාණයක් (6 - 2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ MN - 1 වැටුප් ක්‍රමය) හිමි පරිවාස කාලය ඉක්මවූ රජයේ නිලධාරීන් **<u>සේවා අවශ්‍යතාවක් ඇති වුවහොත් පමණක්</u>** ජන්ද ලිපිකරුවන් ලෙස සේවයේ යොදවා ගත හැකි බැවින් එවැනි නිලධාරීන් ද දත්ත පත්‍ර සම්පූර්ණ කර එවිය යුතුය.

ඉහත නිලධාරීන් වර්ග කිරීමේදී වැටුප් පියවරයන් ගණනය කර ඇත්තේ 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 සහ 2007.08.24 (IV) චක්‍රලේඛයන්හි ප්‍රකාර 2007.12.31 දක්වා ගෙවන වැටුප පදනම් කරගෙනය.

08. **පොදු කරුණු :-**

08.01 නිලධාරියෙකුගේ වැටුප පිළිබඳව තීරණය කිරීමේදී ඔහුට ගෙවන දීමනා සැලකිල්ලට නොගත යුතුය.

08.02 CSEP ආකෘතිපත්‍ර ඉදිරිපත් කිරීමේදී නිලධාරීන්ගේ ආසන්නතම ජොෂ්ඨතා අනුපිළිවෙල අනුව නම් සටහන් කළ යුතුවේ. **අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු හෝ පාසැල් වෙනුවෙන් සංකේත අංකයක් සඳහන් කර ඇත්නම් CSEP ආකෘතිවල අදාළ ස්ථානයේ එම සංකේත අංකය සටහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.**

08.03 තම කොට්ඨාසය තුළ සිදුකළ යුතු කාර්යයන් සඳහා තේරීම්භාර නිලධාරීට හෝ පොලිසියට සහාය වීමට අවශ්‍ය වුවහොත් එසේ සහායවීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් තම තමන්ගේ කොට්ඨාස තුළ රැඳී සිටිය යුතු බැවින්, ඔවුන් ජන්ද විමසීම් කාර්ය මණ්ඩලයට ඇතුළත් කළ යුතු නොවේ.

08.04 තම නිල තත්ත්වය හේතුවෙන් ජන්ද විමසීම් කාර්යයන් සඳහා පත් කරනු ලැබීමට සුදුසු නොවන අධිකරණ නිලධාරීන්, පොලිස් සේවයේ නිල ඇඳුම්ධාරීන් හෝ ග්‍රාම නිලධාරීන් ලවා මෙම ආකෘති පත්‍ර ඉදිරිපත් කිරීමක් අපේක්ෂා නොකෙරේ.

08.05 කණිෂ්ඨ සේවක මහතුන් ලවාද මෙම ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමක් අපේක්ෂා නොකෙරේ. එහෙත් ජන්ද විමසීම් මූලික කටයුතු සඳහා ලබාදිය හැකි කණිෂ්ඨ සේවක මහතුන්ගේ සහාය ලබාදෙන ලෙස තේරීම්භාර නිලධාරීන් ඉල්ලා සිටින අවස්ථාවල දී ඔවුන් ලබාදීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

08.06 නිලධාරීන් ලවා ආකෘතිපත්‍ර සම්පූර්ණ කරවා ඉදිරිපත් කිරීමේ දී ක්‍රියාත්මක වීමට නියමිත ස්ථානමාරු වේ නම් ඒවාද සැලකිල්ලට ගත යුතුවේ. එවැනි ගණයට අයත් නිලධාරීන් වේ නම් ස්ථානමාරු නියෝගයේ පිටපතක් සහ නිලධාරියා නියමිත දින අභිනව සේවා ස්ථානයේ වැඩ භාරගැනීමට නිදහස් කරන්නේ ද යන්න දැක්වෙන ලිපියක් අදාළ නිලධාරියාගේ ආකෘති පත්‍රයට නොගැලවෙන සේ හොඳින් අමුණා එවිය යුතු වේ.

09. **<u>අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලින් අවශ්‍යවන වෙනත් උපකාර -</u>**

කාර්ය මණ්ඩලය සහ වාහන සපයා දීමට අමතරව මෙ ජන්ද විමසීම් පැවැත්වීම පිළිබඳ වෙනත් යම් යම් කරුණු වලදී ද ලේකම්වරුන්ගේ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මෙන්ම ඒ ඒ දිස්ත්‍රික්කවල සිටින ඔවුන්ගේ නියෝජිතයින් ගේ ද සහාය ඇතැම් විට මට සහ තේරීම් භාර නිලධාරීන්ට අවශ්‍ය වන අවස්ථා ඇති විය හැක. මෙහිලා ඔබගේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලා සිටින අතර, දිස්ත්‍රික්කවල සිටින ඔබගේ ප්‍රාදේශීය නිලධාරීන්ට ද එසේ කරන ලෙස උපදෙස් දෙන මෙන් ඉල්ලමි.

10. 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ඊ (1), (2) හා 104 උ ව්‍යවස්ථාවලින් පැවරී ඇති බලතල පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

දයානන්ද දිසානායක
මැතිවරණ කොමසාරිස්.